චක්‍රලේඛ අංක: 20/75

මගේ අංකය: පස 5/533,
1975 ජූනි මස 13 දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

සියලුම ප්‍රා.අ.අ. සහ ප්‍රා.අ.නි. වරුන් වෙත.

## තනතුරෙන් තනතුරට මාරුවන පිරිවෙන් ගුරුවරුන්ගේ වැටුප් සකස් කිරීම.

භාණ්ඩාගාර අංක 558 ඊ 293/477 ඩීසී හා 1959.02.10 දින, තනතුරෙන් තනතුරකට මාරු වී යන ආධාර ලබන පාසල් ගුරුවරුන් සම්බන්ධයෙන් නිකුත් කරන ලද කොන්දේසි පිරිවෙන් ගුරුවරුන් සඳහා ද යොදා ගැනීම ගැන ආයතන අධ්‍යක්ෂගේ විරුද්ධත්වයක් නොමැති බව මා වෙත දන්වා ඇත. ඒ අනුව,

(i) පිරිවෙනකින් තවත් පිරිවෙනක පත්වීමක් ලබන පිරිවෙන් ව්‍යවස්ථා මාලාවේ 10 වැනි වගන්තිය යටතේ අනුමත ගුරුවරුන් ද,

(ii) රජයේ පාසලක සිට පිරිවෙනක 10 වැනි වගන්තිය යටතේ පත්වීමක් ලබන ගුරුවරුන් ද,

සේවා කැඩීමේ කාලය ද එට හේතු ද නොතකා ඔහු අවසන් වරට ගුරු වෘත්තියෙහි යෙදී සිටි පිරිවෙනේ හෝ පාසලේ දී ලැබූ වැටුප් ලබා දීමට කටයුතු කරන්න.

2. යම් හෙයකින් සේවයේ කැඩීමක් ඇතොත් ගුරුවරයා ඉවත්වන විට ඔහු ලබමින් සිටි වැටුප මත සේවා කාලය සැලකිල්ලට ගෙන ඊළඟ වැටුප් වැඩිවීමේ දිනය තීරණය කළ යුතුය. නිදසුනක් වශයෙන් යම් ගුරුවරයෙකු සේවයෙන් ඉවත් වන විට ඔහු ලබමින් සිටි වැටුප මත මාස දෙකක කාලයක් සේවය කර ඇතොත් එම වැටුප් පරිමාණයේම ඊළඟ වැටුප් පියවරෙහි තැබීම සඳහා ඔහු විසින් තවදුරටත් සේවය කළයුත්තේ මාස 10 ක කාලයක් පමණි.

3. ගුරු සේවයට අයත් නොවන තනතුරුවල සේවයකින් පසුව නැවත ගුරු සේවයට පත්වන ගුරුවරුන්ට ද මෙම නියමය බලපානු ලැබේ.

4. සේවයේ යෙදී සිටිය දී හෝ සේවයෙන් ඉවත් වී නැවත පත් වූ පසු ගුරුවරුන්ගේ සුදුසුකම් වෙනස් වීමේ දී සහ විෂමාචාරය නිසා සේවයෙන් පහකර ඇති විට දී මෙම චක්‍රලේඛයේ නියමයන් බල නොපාන බව සටහන් කර ගන්න.

අ.කගේ/ප්‍රේමදාස උඩගම.
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ.
පිරිවෙන් (පි)

පපි/12